ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2006/2007

නිර්මාණාත්මක සහ සෞන්දර්ය අධ්‍යාපනය හා හසුරු කුසලතා සංවර්ධනය - **ESC 1124/1135**

කාලය පැය දෙකයි.

---

දිනය - 2006.10.22 වේලාව - පෙ.ව.1-30 සිට ප.ව. 3.30 දක්වා

---

එක කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
එක් එක් කොටස සඳහා පිළිතුරු වෙනම පොත්වල ලියන්න. ඒ සඳහා ඔබට පොත් තුනක් ලැබෙනු ඇත.

## <u>පළමුවන කොටස</u>

01. **i.** පෙර පාසල් දරුවන් තුළ දක්නට ලැබෙන නිර්මාණාත්මක හැකියා <u>තුනක්</u> නම් කරන්න.

(ලකුණු 03)

**ii.** ඔබ නම් කළ හැකියා තුළින් පෙර පාසල් දරුවාගේ

(අ) බුද්ධිය
(ආ) චාලක හැකියා හා
(ඇ) චිත්තවේග

සංවර්ධනය වන අයුරු විග්‍රහ කරන්න.

(ලකුණු 12)

**iii.** ඔබ පන්තියේ සිටින ඔබ සෑහීමකට පත්වන අයුරින් නිර්මාණාත්මක හැකියා ප්‍රදර්ශනය නොකරන දරුවකු සම්බන්ධයෙන් ඔබ ගන්නා ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. **i.** ළමා චිත්‍රවල අවධි නම් කරන්න. (ලකුණු 02)

**ii.** ළමා චිත්‍ර අවධිවලට වෙන් කිරීමේ පදනම කුමක්දැයි දක්වන්න.

(ලකුණු 03)

**iii.** ඔබ නම් කළ අවධීන්ගෙන් එකක් තෝරාගෙන ඒ තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 10)

**iv.** එම අවධිය තුළ දරුවකුගේ නිර්මාණ හැකියා සංවර්ධනය කිරීමේදී දෙමාපියන් සතු කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

## දෙවන කොටස

03. i. ළමා ගීත ඇසුරින් සංවර්ධනය කළ හැකි භාෂා කුසලතා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ළමා ගීතයක් ලියන්න. ඒ ඇසුරින් ඔබ ඉහත පැහැදිලි කළ කුසලතා සංවර්ධනය කළ හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 15)

04. i. "සුළඟ" "අහස" "සරුංගලය" යන තේමාවන්ගෙන් එකකට අදාල වන පරිදි කතාන්තරයක් කෙටියෙන් ලියන්න.

(ලකුණු 10)

ii. එම කතාන්තරයෙන් ඉටු කර ගැනීමට අදහස් කරන අරමුණු පහ (5) ක් දක්වන්න.

(ලකුණු 05)

iii. එම අරමුණු ඉටුකර ගැනීම සඳහා කතන්තර ඉදිරිපත් කරන ආකාරය පියවරෙන් පියවර විස්තර කරන්න.

(ලකුණු 10)

## තෙවන කොටස

05. i. හසුරු කුසලතා සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද ?

(ලකුණු 05)

ii. පෙර පාසල් වියේ දරුවන්ගේ හසුරු කුසලතා සංවර්ධනය කිරීම තුළින් අපේක්ෂිත අරමුණු පහක් (05) දක්වන්න.

(ලකුණු 10)

iii. ඔබ දැක්වූ අරමුණු අතරින් දෙකක් තෝරාගෙන එම අරමුණු ඉටු කර ගැනීමට ඔබට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 10)

06. i. පෙර පාසල් දරුවන් තුළ හසුරු කුසලතා සම්බන්ධයෙන් දැකගත හැකි දුර්වලතා පහක් දක්වන්න.

(ලකුණු 05)

ii. එම දුර්වලතාවන්ගෙන් ඕනෑම දෙකක් විස්තර කරන්න.

(ලකුණු 10)

iii, එම දරුවන්ගේ පෙර ලිවීමේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා සංවිධානය කළ හැකි ක්‍රියාකාරකමක් විස්තර කරන්න.

(ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -